# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1954/33 - 2016 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13 දරන 2015.09.21 දිනැති *අතිවිශෙෂ ගැසට් නිවේදනය* මගින් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත "අපේ ගම" ආයතනය පවරා ඇති හෙයින් ;

එහි පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය උපලේඛනයේ සඳහන් සාමාජිකයන්ගෙන් යුත් පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබේ.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

වර්ෂ 2016 ක් වූ පෙබරවාරි මස 16 දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

*උපලේඛනය*

***අපේ ගම ආයතනයේ පාලක මණ්ඩලය පිළිබඳ දැන්වීම***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13 දරන 2015.09.21 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් අධ්‍යාපන අමාත්‍යවරයා වෙත පවරන ලද අපේ ගම ආයතනයේ පරිපාලනය, මූල්‍ය කළමනාකරණය සහ පාලනය මෙහි මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සංයුක්ත කරනු ලබන පාලක මණ්ඩලයක් වෙත එම කාර්යයන් සිදුකිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සම්පාදනය කර ගැනීම දක්වා බලපවත්වන අන්තර්කාලීන විධිවිධානයක් ලෙස පවරනු ලැබේ.

පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(i) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකු

1A - G 23051 — 56 (2016/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු
(iii) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් 04 දෙනෙකු

(iv) නිල බලයෙන් සාමාජිකයන් වන පහත සඳහන් තැනැත්තන්, එනම් :-

(අ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු

(ආ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී.

(ඇ) මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියකු

මණ්ඩලයේ යම් රැස්වීමක සනපූර්ණය සාමාජිකයන් 05 ක් විය යුතුය.

පාලක මණ්ඩලයේ බලතල පහත දැක්වෙන පරිදි විය යුතුය :-

(i) අපේ ගම ආයතනයේ මූල්‍ය කළමනාකරණය සහ පාලනය
(ii) ආයතනයේ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීම හා පරිපාලනය.
(iii) අපේ ගම ආයතනය සංවර්ධනය සඳහා සැලසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම සහ නියාමනය.
(iv) පාලක මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදලක් ස්ථාපනය කර පවත්වාගෙන යාම.

3 - 134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.